UNITED NATIONS
SRI LANKA
TOGETHER FOR SUSTAINABLE DEVELOPMENT

# මාධ්‍ය නිවේදනය

### ක්ෂණික සම්ප්‍රේෂණය සඳහා

## එක්සත් ජාතීන්, සිය 73වැනි සංවත්සරය සමරයි

**2018 ඔක්තෝබර් 25, කොළඹ:** මානව හිමිකම්, සාමය සහ ආරක්ෂණය, හා සංවර්ධනය සම්බන්ධයෙන් ලොව ජනතාව වෙත කැපවීම විදහා දැක්වෙන තම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සනිටුහන් කරමින්, එක්සත් ජාතීන් සිය 73 වැනි සංවත්සරය සමරනු ලැබීය.

ශ්‍රී ලංකාව සමඟ වසර 63ක හවුල්කාරත්වයක් සහිතව, රටෙහි ප්‍රමුඛතාවන් ළඟා කරගැනීම පිණිස එහි ජනයා හා එක්ව නිරන්තරයෙන් කටයුතු කරනු ලබන එක්සත් ජාතීන්ගේ කැපවීම තවදුරටත් ශක්තිමත් ව පවතියි. තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඇතුළත් 2030 න්‍යායපත්‍රයට අනුව, එකට එක් ව ගමන් කිරීමට අදහස් කරන අපගේ ඉදිරි ගමනේ දී, ඉතාමත් ළාබාල මෙන්ම වඩාත්ම උදවු උපකාර අවැසි අය ද ඇතුලු සියලුදෙනාම පිළිබඳ නිසි අවධානය යොමු කෙරෙනු ඇත.

තරුණ පරපුර ද ඇතුළුව සියලුදෙනාටම සවන්දීම මඟින් සියල්ලන් ඇතුළත් වූ සංවර්ධනයක් ළඟා කරගත හැකි වේ. එහි දී, තිරසර ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමෙහි ලා පෙරමුණ ගැනීමට ඔවුන් වෙත අවස්ථාව ලබාදීම ඉතා වැදගත් වේ. අද වනවිට ශ්‍රී ලංකාවේ වෙසෙන වයස අවුරුදු 10ත් 24ත් අතර ජනගහනය බිලියන 1.8කි. එනයින් ගත් කළ දැනට ලෝක ඉතිහාසයේ විශාලතම තරුණ පරම්පරාව වන්නේ ශ්‍රී ලංකාවේ සිටිනා මෙම තරුණ පරම්පරාවයි. ශ්‍රී ලංකාවේ සම්පූර්ණ ජනගහනයෙන් හතරෙන් එකකට ආසන්න කොටසක් ම අයත් වන්නේ තරුණ පරම්පරාවටයි. ඉහත කී ඉලක්ක ළඟා කරගැනීමෙහි ලා එකී තරුණ පරම්පරාව, වෙනසක්-ඇති කරන්නන් සහ හවුල්කරුවන් වශයෙන් කටයුතු කරන්නට එක්සත් ජාතීන් විසින් දිරි ගන්වනු ලබයි.

තරුණ පරම්පරාව වෙත ඇති අතිවිශාල හැකියාවන් හඳුනා ගනිමින්, එක්සත් ජාතීන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක් ව තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාකාරී වැඩසටහන දියත් කරන ලදී. ඒ හරහා, මෙකී ඉලක්ක ළඟා කරගැනීමෙහි ලා සිසුන්-පෙරමුණ ගනු ලබන මුලපිරීම් වෙත සහය ලබාදීමට අදහස්

කෙරේ. විශේෂ රූස්වීමක ආකාරයෙන් ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශවල ජාතික පාසල් හි දී සිසු දරුවන් සමඟ එක්සත් ජාතීන්ගේ දිනය සැමරීම හරහා මෙම වැඩසටහන, මෙම වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන ගෙනයාම සිදු කෙරෙයි.

සමානාත්මතාව, මානව හිමිකම් සහ මානව ගෞරවය උදෙසා කටයුතු කරනු ලබන එක්සත් ජාතීන්, සංවර්ධනය, දේශගුණික ක්‍රියාවලිය, සාමය-ගොඩනැගීම, ප්‍රතිපත්ති සහ නව්‍යකරණය සම්බන්ධයෙන් සහය පළ කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම පිණිස නව ක්‍රමවේදයන් අනුගමනය කිරීමට කැපවී සිටියි; එමගින්, කිසිවෙකු හෝ අත් නොහැරුණු බව සහතික කෙරෙයි.

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන් වෙත මගපෙන්වීම සිදු කෙරෙනුයේ, සියලුදෙනාගේ පිළිගැනීමට ලක් ව ඇති 2018 – 2022 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන කාර්ය රාමුව මගින් ය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන් විසින් සාමකාමී, සාධාරණ, සියලුදෙනාම ඇතුළත් කරගත් සහ අපක්ෂපාතී සංවර්ධනයක් ළඟා කරගැනීම උදෙසා සහය පළ කරමින් තවදුරටත් එකාවන් ව කටයුතු කරනු ඇත.